# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.06.20 පැය 1630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1004 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ඩෙංගු මර්ධනය වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය, සෞඛ්‍ය අංශ හා අදාල රාජ්‍ය ආයතන සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන විශේෂ වැඩසටහන් සම්බන්ධව.**

රටතුල මේ දිනවල ඩෙංගු රෝගීන්ගේ සීග්‍ර වර්ධනයක් නිරීක්ෂණය වීම හේතුවෙන් මතු වී ඇති සෞඛ්‍ය ගැටළුව වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය මේ සඳහා මැදිහත් වීම සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගේ දැඩි අවධානය යොමු වී ඇත.

පොලිස් පරිසර ආරක්ෂක කොට්ඨාසය හා පොලිස් ස්ථානයන්හි ස්ථාපිත පරිසර අංශයන්හි නිලධාරීන්, ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයන් හා එක්ව මහජනයා දැනුවත් කරමින් මෙය වළක්වා ගත හැකි ක්‍රමවේදයන් සම්බන්ධව මහජනතාවට අවශ්‍ය මඟපෙන්වීම් සිදු කිරීම මේ වන විටත් ආරම්භ කර ඇත.

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, අනෙකුත් සෞඛ්‍ය අංශ නිලධාරින්, ආරක්ෂක අංශ හා රාජ්‍ය ආයතන සමඟ එක්ව ඩෙංගු මර්ධනය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් නිවාස, නිවාස සංකීර්ණ, පාසල්, රාජ්‍ය ආයතන, සේවා ස්ථාන, ආගමික ස්ථාන හා ඉදිකිරීම් පරිශ්‍ර මූලික කරගෙන පරීක්ෂාවන් සිදු කිරීම ඉහත වැඩපිළිවෙල යටතේම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

මහජනතාව ලෙස ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පදිංචි නිවාස වලට හෝ ආයතන පරිශ්‍රයන් වෙත පැමිණෙන පොලිස් නිලධාරීන්, සෞඛ්‍ය අංශ නිලධාරීන්ට අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙසත්, තමන් ජීවත් වන වටපිටාව ඩෙංගු මදුරුවන් ව්‍යාප්ත නොවන ආකාරයට පිරිසිදුව පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසත් ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

එසේම ඩෙංගු රෝගය ව්‍යාප්තිය සඳහා ක්‍රියා කරනු ලබන තැනැත්තන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ (262 වන වගන්තිය) හා අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව මෙන්ම පොලිස් ආඥා පනත යටතේද ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියා කරනු ඇත.

මෙසේ නොසැලකිලිමත්ව ඩෙංගු මදුරුවන් බෝවන ආකාරයට එම පරිශ්‍රයන් පවත්වාගෙන යන්නන්ට අවවාද කිරීමත් සමඟම නිතර නිතර එම පරිශ්‍රයන් පරීක්ෂා කිරීමේදී නොසැලකිලිමත්ව ක්‍රියාත්මක වීම නීතිමය පියවරයන්ට මුහුණ පෑමට සිදු වනු ඇත.

මෙම සතිය තුල මෙසේ ඩෙංගු මදුරුවන් බෝවීමට ඉඩ සලස්වා තම පරිශ්‍රයන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පුද්ගලයන් 76 දෙනෙකුට එරෙහිව නඩු පැවරීමටද ශ්‍රී ලංකා පොලිසිය කටයුතු කර ඇත.

මෙම ජාතික වැඩපිළිවෙල සඳහා ශ්‍රී ලංකා පොලිසිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ එක්ව කටයුතු කර මෙම උවදුර වළක්වා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## டெங்கு ஒழிப்பிற்காக இலங்கைப் பொலிஸார், சுகாதாரத் துறை மற்றும் தொடர்புடைய அரச நிறுவனங்களுடன் இணைந்து முன்னெடுக்கும் விசேட வேலைத்திட்டங்கள் தொடர்பாக

நாட்டில் இந்நாட்களில் டெங்கு நோயாளர்களின் எண்ணிக்கை வேகமாக அதிகரித்து வருவதால் உருவாகியுள்ள சுகாதாரப் பிரச்சினையைத் தடுக்கும் நோக்கில் இலங்கைப் பொலிஸார் தலையீடு செய்வது தொடர்பாக பொலிஸ்மா அதிபரின் விசேட கவனம் செலுத்தப்பட்டுள்ளது.

பொலிஸ் சுற்றுச்சூழல் பாதுகாப்புப் பிரிவு மற்றும் பொலிஸ் நிலையங்களில் இயங்கும் சுற்றுச்சூழல் பிரிவுகளின் அதிகாரிகள், சமூகப் பொலிஸ் குழு உறுப்பினர்கள் ஆகியோரின் பங்களிப்புடன், டெங்கு பரவலைத் தடுக்கக்கூடிய வழிமுறைகள் குறித்து பொதுமக்களுக்கு விழிப்புணர்வு வழங்கும் நடவடிக்கைகள் ஏற்கனவே ஆரம்பிக்கப்பட்டுள்ளன.

பொது சுகாதாரப் பரிசோதகர்கள், ஏனைய சுகாதாரத் துறை அதிகாரிகள், பாதுகாப்புப் பிரிவுகள் மற்றும் அரச நிறுவனங்களுடன் இணைந்து டெங்கு ஒழிப்பிற்கான விசேட வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. இதன் கீழ் வீடுகள், வீட்டு வளாகங்கள், பாடசாலைகள், அரச நிறுவனங்கள், பணியிடங்கள், வழிபாட்டுத் தலங்கள் மற்றும் நிர்மாணப் பணிகள் நடைபெறும் இடங்கள் உள்ளிட்ட பகுதிகளில் விசேட பரிசோதனைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

டெங்கு ஒழிப்பு நடவடிக்கைகளை வெற்றிகரமாக முன்னெடுக்க வீடுகள் மற்றும் நிறுவன வளாகங்களுக்கு வருகை தரும் பொலிஸ் மற்றும் சுகாதாரத் துறை அதிகாரிகளுக்கு முழுமையான ஒத்துழைப்பை வழங்குமாறும், தாங்கள் வசிக்கும் சூழலை டெங்கு நுளம்புகள் பெருகாத வகையில் சுத்தமாகவும் பாதுகாப்பாகவும் பேணுமாறும் பொதுமக்களிடம் இலங்கைப் பொலிஸார் கேட்டுக்கொள்கின்றனர்.

மேலும், டெங்கு நுளம்புகள் பெருகக்கூடிய சூழலை ஏற்படுத்தும் நபர்களுக்கு எதிராக இலங்கை தண்டனைச் சட்டக் கோவையின் 262ஆம் பிரிவு, குற்றவியல் நடைமுறைச் சட்டக் கோவை மற்றும்

பொலிஸ் கட்டளைச் சட்டத்தின் கீழ் சட்ட நடவடிக்கைகள் எடுக்கப்படவுள்ளன.

அத்துடன், அலட்சியமாக டெங்கு நுளம்புகள் பெருகக்கூடிய சூழலை பராமரித்து வரும் நபர்களுக்கு முதற்கட்டமாக எச்சரிக்கை வழங்கப்படும். இருப்பினும், தொடர்ச்சியான பரிசோதனைகளின் போது அதே நிலைமை மீண்டும் கண்டறியப்பட்டால், அவர்களுக்கு எதிராக சட்டரீதியான நடவடிக்கைகள் எடுக்கப்படும்.

**இதே வாரத்தில், டெங்கு நுளம்புகள் பெருகுவதற்கு இடமளிக்கும் வகையில் தங்களது வளாகங்களை பராமரித்து வந்த 76 பேருக்கு எதிராக வழக்குத் தொடரவும் இலங்கைப் பொலிஸார் நடவடிக்கை எடுத்துள்ளனர்.**

இத்தேசிய வேலைத்திட்டத்தை வெற்றிகரமாக முன்னெடுப்பதற்காக இலங்கைப் பொலிஸாரும் ஏனைய அரச நிறுவனங்களும் இணைந்து செயல்பட்டு வருகின்றன. இந்த டெங்கு அபாயத்தைத் தடுப்பதற்காக தேவையான ஒத்துழைப்பை வழங்குமாறு இலங்கைப் பொலிஸார் பொதுமக்களிடம் அன்புடன் கேட்டுக்கொள்கின்றனர்.

***பொலிஸ் ஊடகப் பிரிவு.***